දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම භාග (බාහිර) පරීක්ෂණය
2011 ඔක්තෝබර්/නොවැම්බර්
General Degree Examination in Arts (External) Part I
October/November 2011

# භූවිසා 2.1 - සම්පත් සංවර්ධනය හා සැලසුම්කරණය
# GYG 2.1 - Resource Development and Planning

කාලය පැය තුන යි.

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**
(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.)

---

(01) 'සම්පත්' අර්ථ දක්වා, වර්ගීකරණය කොට, සම්පත් පිළිබඳ ඇගයුම පුළුල් වීම කෙරෙහි බලපාන සාධක නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

(02) "සම්පත් උපයෝජනය, සංවර්ධනය හා සංරක්ෂණයෙහි ලා මිනිසා තීරණාත්මක සාධකයකි." විමසන්න.

(ලකුණු 20 යි)

(03) ශ්‍රී ලංකාවේ සම්පත් පරිහරණයෙ හි ලා බලපාන ප්‍රධාන ගැටලු 5 ක් උචිත නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

(04) "ලෝකයේ බිලියන 1.1 ක පමණ ජනසංඛ්‍යාවක් පිරිසිදු ජල භාවිතයෙන් තොරව පීඩා විඳිති." ගෝලීය ජල අර්බුදය හේතු කොට ගෙන පැන නැගී ඇති ගැටළු හා අභියෝග පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

(05) ගෝලීය ව, රටවල් අතර ආහාර නිෂ්පාදනයේ දී සහ පරිභෝජනයේ දී වර්තමානයේ මුහුණ දෙන ගැටළු සහ ප්‍රතිවිපාක නිදර්ශනාත්මක ව විභාග කරන්න.

(ලකුණු 20 යි)

(06) I. ගෝලීය ව වනාන්තර හායනයට බල පා තිබෙන හේතු සහ එය හේතු කොට ගෙන මතු වී තිබෙන ගැටළු පෙන්වා දෙන්න.

(ලකුණු 10 යි)

II. "භූමි සම්පත, ගෝලීය ව හිඟ සම්පතක් ලෙසට නුදුරු දිනක දී ම සම්පත් විද්‍යාඥයින් ප්‍රකාශ කරනු ඇත." ඉහත ප්‍රකාශයට ඔබට එකඟ විය හැකි ද? නිශ්චිත කරුණු පෙන්වා දෙමින් විභාග කරන්න.

(ලකුණු 10 යි)

(07) සම්පත් සංරක්ෂණය යනු කුමක්දැයි හඳුන්වා, සම්පත් සංරක්ෂණයකින් හා නිසි කළමණාකරණයකින් තොරව, අප සතු ස්වභාවික සම්පත් පරිහරණය කිරීම තුළින් තිරසර සංවර්ධනයක් ලඟා කර ගත හැකි ද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

(08) ගෝලීය ව, විවිධ බලශක්ති ප්‍රභවයන්හි නිෂ්පාදන හා පරිභෝජන රටාවන්හි පවතින වෙනස්කම් පෙන්වා දී, පසුගිය දශකය තුළ ලෝකයේ ආර්ථික අර්බුද ඇති වීම කෙරෙහි එහි බලපෑම කෙබඳු දැයි පරීක්ෂා කරන්න.

(ලකුණු 20 යි)

****************************************